# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**

සභාපතිතුමා,

මැතිවරණ කොමිසන් සභාව

සරණ මාවත,

රාජගිරිය

17- 03- 2020

සභාපති තුමනි,

**කොරොනා වසංගතය මැඩලීමට මුල් තැන දෙමු. පාර්ලිමේන්තු මැතිවරණය කල් දමමු.**

රට තුළ දෛනිකව කොරොනා රෝගීන්ගේ ප්‍රතිශතය වැඩි වන බවක් දක්නට ලැබේ. එබැවින් මේ මොහොතේ සියලුම පාර්ශව කිසිඳු භේදයකින් තොරව සාමුහිකව ජාතික ව්‍යසනය මැඩලීම සඳහා කටයුතු කලයුතුව ඇත. කිසිවෙකු මෙම තත්වයෙන් දේශපාලන වාසි ලබා ගැනීමට උත්සහ කරන්නේ නම්, එය මනුෂ්‍යත්වයට නොගැලපේ. මේ මොහොතේ ආණ්ඩුවේත්, විපක්ෂයේත් සියලු දේශපාලන නායකත්වයේ ප්‍රමුඛ අවධානය මෙම වසංගතය මැඩලීම කෙරෙහි යොමුවිය යුතුව ඇතත්, දෛනිකව අප දකින දේශපාලන මාධ්‍ය හමු වලින් පෙනී යන්නේ තවමත් ඇතමුන්ගේ අවධානය මේ කෙරෙහි ප්‍රමාණවත්ව යොමු වී නැති බවයි. එමෙන්ම, මේ මොහොතේ දිස්ත්‍රික් ලේකම්වරයාගේ සිට සියලුම රාජ්‍ය නිලධාරින්, සිවිල් සංවිධාන සහ පුරවැසි සියලුදෙනා ද මේ තත්වය මැඩලීම කෙරෙහි ආත්මාර්ථයෙන් තොරව, කටයුතු කල යුතුව ඇත. එබැවින් අප සියලුමදෙනා සියලු භේද අමතක කර රජයට සහ සෞඛ්‍ය අංශවලටත් අවශ්‍ය සහයෝගය ලබාදිය යුතුව ඇත.

එමෙන්ම මැතිවරණය යනු ජනතාව ඒකරාශි වන ක්‍රියාවලියකි. දිස්ත්‍රික් ලේකම්වරයාගේ සිට ග්‍රාම නිලධාරිවරයා දක්වා බොහෝ රාජ්‍ය නිලධාරින් මැතිවරණ ක්‍රියාවලියට සම්බන්ධ වේ. ඒ අනුව කොරොනා වෛරසයෙන් ජනතාව ආරක්ෂා කිරීමට කටයුතු කල හැකි නිලධාරින් බොහොමයකට එම කටයුතු සඳහා අවධානය යොමු කිරීමට නොහැකි වනු ඇත. එමෙන්ම ඔවුන්ගේ ආරක්ෂාව ද සැලකිල්ලට ගත යුතුව ඇත. සෞඛ්‍ය අංශ වලට අනුව මෙම තත්වය පාලනය කිරීමට හැකිතාක් ජනතාව ඒකරාශි වීම වැලැක්විය යුතුය.

# No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2 558 570 / 11 2 558 571 Fax: (+94) 11 2 558 572
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk

Scanned with CamScanner

එබැවින් අප ඔබ කොමිසන් සභාවෙන් ඉල්ලා සිටින්නේ මේ මොහොතේ රට මුහුණ දෙමින් සිටින ජාතික ව්‍යසනය සැලකිල්ලට ගනිමින් ජනතාව ඒකරාශී වන මැතිවරණ ක්‍රියාවලිය කල් දැමීම කෙරෙහි අවධානය යොමු කරන ලෙසයි. අප තීන්දු ගැනීමට ප්‍රමාද වන සෑම මොහොතකම ආපසු හැරවිය නොහැකි අවධානමකට සමාජය ලක් වීමට ඉඩ ඇත.

යම්හෙයකින් නාමයෝජනා වලින් අනතුරුව ඡන්දය කල් දැමීමට ලක් වුවහොත්, සමහර දේශපාලඥයින් තම අපේක්ෂකත්වය තහවුරු වී ඇති නිසා, කිසිවකුගේ බාධාවකින් තොරව, ජාතික ව්‍යසනය නොසලකා ප්‍රචාරණ කටයුතු වල යෙදීමටද ඉඩ ඇත. මේ පිළිබඳවද ඔබතුමාගේ අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

ස්තුතියි.

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂක

පිටපත් - උනන්දුවක් දක්වන ආයතන

Scanned with CamScanner